# <u>පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය</u>

AAT/ 47/2019 (NPC)

පොලිස් පරීක්ෂක
කාංචන විමලවීර,
**අභියාචක**

**<u>එදිරිව</u>**
ජාතික පොලිස් කොමිසම
**වගඋත්තරකරු**

**දිනය :- 2025.04.24**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂක ආර්.එම්.එස්.පී.රණසිංහ මහතා.

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා,**

## -<u>නියෝගය</u>-

පොලිස් පරීක්ෂක කාංචන විමලවීර යන අභියාචක වෙත, චෝදනා තුනක් ඇතුළත් වූ චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ඔහුට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇත. එම විනය පරීක්ෂණය අවසානයේ දී එකී විනය පරීක්ෂණය පැවැත්වූ රන්මුතුගේ එස්. ප්‍රනාන්දු යන අය විසින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා තුනෙන් ම 2017.04.08 වෙනි දින අභියාචක නිදහස් කර ඇත. විනය පරීක්ෂණ නිලධාරියා විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව පදනම් කර ගෙන, උතුර පළාත භාරව සිටි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රොෂාන් ප්‍රනාන්දු විසින්, 2017.10.20 වෙනි දින කරන ලද නියෝගය අනුව, අභියාචක නිදහස් කර තිබූ පළමු සහ දෙවන චෝදනාවන්ට ඔහු වැරදිකරු කරමින්, අභියාචකගේ වැටුප් වර්ධකයක් වසරක කාලයකින් විලම්භනය කර ඇත. එකී දඬුවමට එරෙහිව අභියාචක විසින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළමුත්, එකී කොමිෂන් සභාව විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ තීරණය ස්ථිර කරමින් අභියාචනය ප්‍රතික්ෂේප කර ඇත. එම

තීරණයෙන් අතෘප්තියට පත් අභියාචක, මෙම විනිශ්චය අධිකාරය වෙත 2019.03.01 වෙනි දිනැතිව අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

එකී අභියාචනය මගින් අභියාචක දන්වා ඇත්තේ, විනය පරීක්ෂණය පැවැත්වූ පරීක්ෂණ නිලධාරියා සියළු චෝදනා වලින් ඔහුව නිදහස් කර තිබියදී, ඔහුට විරුද්ධව විනය නියෝගයක් පැනවීම දෝෂ සහගත බවයි. ඒ අනුව ඔහු පවසා ඇත්තේ, ඔහුට එරෙහිව තිබූ චෝදනා විනය පරීක්ෂණයේ දී සනාථ නොවූ බවයි. එබැවින් ඔහු පවසා ඇත්තේ පොලිස් කොමිෂන් සභාව නිසි අවධානයක් නොමැතිව ඔහුට විරුද්ධව තීරණයකට එළඹී ඇති නිසා, ඔහු වෙත නිකුත් කර ඇති විනය නියෝගය ඉවත් කරන ලෙසයි.

අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ තුන්වන චෝදනාවෙන් අභියාචක නිදහස් කිරීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාද තීරණය කර ඇත. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත සහ මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනය ඉදිරිපත් වන්නේ අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ පළමු චෝදනා දෙක සම්බන්ධයෙන් පමණි. එකී චෝදනා දෙක වන්නේ,

- අපකීර්තිදායක හැසිරීම සහ,
- අණට අකීකරුව හෝ පීඩාකාරී ලෙස හැසිරීම

යන චෝදනාවන්ය.

එකී චෝදනා දෙකට පදනම වී ඇත්තේ, අභියාචක නාරාහේන්පිට පොලිස් ගරාජයේ සේවය කරන ලද කාලපරිච්ඡේදය තුළදී, ප්‍රියංකා හේමමාලි පෙරේරා නැමැත්තියට, විවාහ පොරොන්දුවක් ලබාදී, අඹුසැමියන් ලෙස ජීවත් වෙමින්, ඇයව රැවටීම සහ ඇයගේ ව්‍යාපාර වලට අනිසි ලෙස මැදිහත් වී මුල්‍ය වංචා කරමින්, ඇය අපහසුතාවයට සහ ඇයගේ සමීපතමයන් සම්බන්ධයෙන් ඔවුන් තුළ අප්‍රසාදයක් ඇතිවන ආකාරයෙන් කටයුතු කිරීමයි. එසේ නම් මෙම චෝදනා සියල්ල බොහෝ දුරට පදනම් වී ඇත්තේ, ඉහත කී හේමමාලා පෙරේරා නැමැත්තියගේ සාක්ෂි මතයි. විනය පරීක්ෂණයට සහභාගී වෙමින්, 2017.01.06 වෙනි දින සහ 2017.01.15 දින දෙක තුළ දී, ඇය විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. ඇයගේ මූලික සාක්ෂිය වශයෙන් සළකා ක්‍රියාකර ඇත්තේ, ඇය විසින් මූලික විමර්ශණයේ දී ලබා දෙන ලද ප්‍රකාශයයි. එකී මූලික ප්‍රකාශය ඇය විසින් ලබා දී ඇත්තේ 2015.05.05 වෙනි දින දීය. ඇය එහිදී ප්‍රකාශ කර ඇත්තේ, අභියාචක විසින් ඇය වෙත විවාහ යෝජනාවක් කිරීමෙන් අනතුරුව, දෙදෙනා අඹුසැමියන් වශයෙන් ජීවත් වූ බවයි. ඒ අනුව අභියාචක ඇයගේ නිවසේ නතර වී, එම අවස්ථාව වන විට වසර 12ක පමණ කාලයක් ජීවත්ව සිට ඇති බවට ඇය ප්‍රකාශ කර ඇත. ඔවුන්ගේ විවාහය ලියාපදිංචි නොකලද, ඒ වන විට වසර 12 ක පමණ එකට ජීවත් වූ බවටද ඇය දෙවන වරටත් පැහැදිලිව සඳහන් කර ඇත. ඉන් අනතුරුව ඇය විසින් පවත්වා

ගෙන යන ව්‍යාපාර කටයුතු සම්බන්ධව පැන නැඟුනු ආරවුලක් හේතුවෙන්, දෙදෙනා අමනාප වී ඇත. එසේ අමනාපවීමෙන් අනතුරුව ඇය විසින් බොරලැස්ගමුව පොලීසියට පැමිණිල්ලක් කර ඇත. ඒ සම්බන්ධයෙන් ඇය විසින් ලබා දී ඇති සාක්ෂිය පහත සඳහන් වේ.

> **"වසර 12 ක් පමණ කාලයක් චූදිත නිලධාරී විමලවීර මහතා මා සමඟ එකට ජීවත් වී, පසුව මා අතහැරයාම හේතුවෙන් මා ඉතා අසීරුතාවකට මුහුණ දී ඇති බව වැඩිදුරටත් කියා සිටිමි."** (2017.01.06 දින මූලික සාක්ෂිය)

ඇය හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, චූදිත නිලධාරියා සමඟ ඇය පවුල් ජීවිතය ආරම්භ කළේ 2005 වර්ෂයේ දී බවත්, ඒ වන විට ඇය දික්කසාද වි සිටි බවත්ය. ඇය තවදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇති පරිදි, අභියාචක සහ ඇය විසින් පවත්වා ගෙන ගිය ව්‍යාපාර කටයුතු අවසන් කර, 2015.12.14 වෙනි දින බදු ඔප්පුව ද අවලංගු කර, කඩය අභියාචක වෙත භාරදී, එකී ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පැවති ආරවුල සමථ මණ්ඩලය ඉදිරියේ පැවැත්වූ පරීක්ෂණයකින් අනතුරුව, එකඟත්වයට පැමිණ සමථයකට පත්කර ගෙන ඇත. එය විවාදයකින් තොරව පිළිගත් කරුණක් වූ අතර, එම තත්ත්වය සළකා බලා අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති එකී තුන්වන චෝදනාවෙන් අභියාචක නිදහස් කර ඇති බව පෙනී යයි.

කෙසේ වෙතත් දඬුවම් නියම කර ඇති චෝදනා දෙක වන්නේ, අපකීර්තිදායක හැසිරීම සහ, අණට අකීකරුව හෝ පීඩාකාරී ලෙස හැසිරීම යන චෝදනාවන්ය. එම චෝදනා දෙකට වරදකරු කර ඇති බව බැලූ බැල්මටම පෙනී යන්නේ, අභියාචක ඔහුගේ විවාහය පවතින අතරතුර වෙනත් ස්ත්‍රියක් සමඟ අඹුසැමියන් ලෙස ජීවත් වීම නිසා බවයි. මෙහිදී සළකා බැලිය යුතු වැදගත් කරුණක් වන්නේ ඉහත කී සම්බන්ධය හේතුවෙන් අභියාචකගේ නිත්‍යානුකූල පවුලේ සාමාජිකයන් විසින් කිසියම් හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, අභියාචකගේ ක්‍රියා කලාපය හේතුවෙන් ඔවුන්ට කිසියම් හෝ හානියක් සිදුවූ බවට සාක්ෂි ඉදිරිපත් වී නැති බවයි. ඉදිරිපත් වූ සාක්ෂි අනුව පෙනී යන්නේ මෙම දීර්ඝ කාලීන සම්බන්ධය හේතුවෙන් ඔහුගේ සේවය අපකීර්තිදායක තත්ත්වයකට පැමිණ තිබූ බවට පැමිණිල්ලක් හෝ ලැබී නැති බවයි. තවද ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව අභියාචක, කවරෙකුගේ හෝ අණට කීකරුවී නොසිටීමක් හෝ, පීඩාකාරී ලෙස හැසිරීමක් සම්බන්ධයෙන් වන සාක්ෂියක් ද ඉදිරිපත් වී නොමැත. මෙම තත්ත්වය යටතේ පැහැදිලි වන්නේ විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා නිවැරදි තීරණයකට එළඹ ඇති බවයි.

කිසියම් විනය පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලබන විනිශ්චය සභාවේ නිගමන සියල්ලම හෝ කිහිපයක් හෝ එක් නිගමනයක් හෝ පිළිගැනීමට, නැතහොත් ප්‍රතිශෝධනය කිරීමට විනය බලධාරියාට බලය ඇති බව ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 22:6 වගන්තියේ සඳහන් කර ඇත. කෙසේ වෙතත් එම බලතල පාවිච්චි කිරීමේ දී විනය බලධාරියා විසින් ඉටුකළ යුතු අවශ්‍යතා මෙනවාදැයි ආයතන සංග්‍රහයේ මීළඟ උප වගන්තිය වන 22:7 වගන්තියේ සඳහන් කර ඇත. එහි මෙසේ දක්වා ඇත.

**"එවැනි අවස්ථාවක දී එම තීරණයට පදනම් කර ගනු ලැබූ සියළු හේතු සාධක විනය බලධරයා විසින් අදාළ විනය ගොනුවේ පැහැදිලිවත්, නිශ්චිතවත්, සටහන් කර තැබිය යුත්තේය"**

මෙම අවස්ථාවේ දී විනය බලධාරියා වශයෙන් කටයුතු කරන ලද නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් එකී 22:7 වගන්තියේ සඳහන් අවශ්‍යතා සටහන් කර තිබේදැයි පරීක්ෂා කර බලමි. විනය නියෝගය පරීක්ෂා කිරීමේ දී පෙනී යන්නේ විනය බලධාරියා විසින්, විනය පරීක්ෂණයේ දී ගනු ලැබූ තීරණයන් සළකා බලමින් දඬුවම් නියම කිරීම සඳහා වූ හේතූන් ඇතුළත් දීර්ඝ විස්තරයක් එකී විනය නියෝගයේ සඳහන් කර ඇති බවයි. විශේෂයෙන්ම එම නියෝගයේ මෙසේ සඳහන් කර ඇත.

**" ඒ අනුව ඉදිරිපත් වී ඇති සාක්ෂි කෙරෙහි සියුම්ව අවධානය යොමු කිරීමේ දී, පෙනී යන්නේ චූදිත නිලධාරියා රාජකාරියේ දී හඳුනාගත් පැමිණිලිකාරිය ඉතා සූක්ෂම ලෙස තමා වෙත පොළඹවා ගනිමින්, ඇයගේ සම්පත් භුක්ති විඳිමින් පසු කළෙක ඇය මග හැරීම පමණක් නොව බලහත්කාරයෙන් ඇයගේ ව්‍යාපාර කටයුතු වලට මැදිහත් වී ඇති බවයි. චූදිත විසින් ඇය මග නොහැර ඇය සමඟ එක්ව වාසය කළ යුතු බවක් එමඟින් අදහස් නොකරන අතර, දරු පවුලක් සහිත විවාහකයෙකුව සිටිමින් හා ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයෙකුව සිටිමින් සමස්ත පොලිසියම අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කර තිබීම සැළකිල්ලට ගනිමින් පරීක්ෂණ නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති නිගමනයන් බැහැර කරමින් විනය බලධරයා වශයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 6:11, 22:5:1, 22:5:2, 22:6, 22:7, සහ 23:3 යන වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව චූදිත පොලිස් පරීක්ෂක කාංචන විමලවීර නිලධාරියාට පහත විනය නියෝගය පනවමි.**

**නියෝගය :-**

**චූදිත පොලිස් පරීක්ෂක කාංචන විමලවීර නිලධාරියාට එරෙහිව නගා ඇති,**

**I. අපකීර්තිදායක හැසිරීම (දෙ.නි. ඒ 07බි පරිශිෂ්ඨයේ 01 වගන්තිය)**

**II. අණට අකීකරුව හෝ පීඩාකාරී ලෙස හැසිරීම (දෙ.නි. ඒ 07බි පරිශිෂ්ඨයේ 02(ජී) වගන්තිය)**

**III. දූෂිත ක්‍රියා (දෙ.නි. ඒ 07බි පරිශිෂ්ඨයේ 07 (ඊ) වගන්තිය**

**යන චෝදනාවන් අතුරෙන් අංක I හා II යන චෝදනා සඳහා ඔහු වරදකරු කරමි.**

**අංක III චෝදනාව ඔප්පු නොවන බවට සලකමි.**

**දඩුවම්**

**චූදිත පොලිස් පරීක්ෂක කාංචන විමලවීර නිලධාරියා වරදකරු කර ඇති චෝදනාවන් 02 සඳහා පොදුවේ දඩුවම් වශයෙන්,**

**01. වැටුප් වර්ධකය වසරක කාලයකින් විලම්භනය කරමි.**"

ඉහත සඳහන් කරුණු සළකා බැලීමේ දී පෙනී යන්නේ, විනය බලධාරියා විසින් ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 22:7 වගන්තියේ සඳහන් පරිදි ඔහු විසින් කටයුතු කර ඇති බවයි. එබැවින් එම නියෝගයේ නීතිමය දෝෂයක් දක්නට නැත.

කෙසේ වෙතත් මෙම නියෝගයෙහි මීට ඉහතින් සඳහන් කර ඇති පරිදි,

- මෙම සිද්ධිය ආරම්භ වී දඩුවම් පැමිණවිමේ අවස්ථාව වන විට, වර්ෂ 12ක පමණ කාලයක් ගතව තිබීම;
- අභියාචකගේ පූර්ව වාර්තාවන්ගේ කිසිදු අසාධු සටහනක් ඉදිරිපත් නොවීම;
- අභියාචකගේ අවශ්‍යතාවය වන්නේ, ඔහුගේ යහපත් දීර්ඝ කාලීන සේවය සළකා බලා, ඔහුට නියමිත උසස්වීම ලබා ගැනීමත් ය.

ඉහත කී කරුණු සළකා බලා, අභියාචක වෙත පනවා ඇති වසරක කාලයක් සඳහා වූ ඔහුගේ "**වැටුප් වර්ධක විලම්භනය කිරීම**" යන නියෝගය ඉවත් කිරීමට තීරණය කරමු. එම දඩුවම් නියෝගය වෙනුවට ආයතන සංග්‍රහයේ 2 කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 24: 2 වගන්තිය අනුව ක්‍රියා කරමින්, සුළු දඩුවමක් ලෙස සළකනු ලබන, 24:2:1 වගන්තියේ සඳහන් "**තරවටු කිරීම**" (අවවාද කිරීම හෝ තදින් අවවාද කිරීම දඩුවමක් නොවේ) යන දඩුවම පැනවීමට නියම කරමි.

අද දින එළඹෙන ලද තීරණය හේතුවෙන් අභියාචකට හිමිවිය යුතු වැටුප් වර්ධක හා අනිකුත් වරප්‍රසාදයන් ද අභියාචකට හිමිවිය යුතුය. මෙම නියෝගය ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කරන ලෙසට ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත නියෝග කරමු. කරුණු සියල්ල සළකා බලා, අභියාචකගේ ඉල්ලීමට ඉඩදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-